# විවිධ භාණ්ඩ පාදක කරගෙන ක්ෂණික නිරූපණයෙහි යෙදෙමු

වේදිකා නාට්‍යක දී නළු නිළියන් භාවිතා කරන උපකරණ හා මෙවලම් නාට්‍යෝපකරණ නම් වේ. නාට්‍යෝපකරණ භාවිතය තම චරිත නිරූපණ කාර්ය වඩාත් සාර්ථක කර ගැනීමට උපකාරී වේ. නාට්‍යකදී හෝ ක්ෂණික නිරූපණයක දී ඕනෑම දෙයක් අවස්ථාවට අනුකූල ව රංග උපකරණයක් සේ භාවිත කළ හැකිවේ.

එහිදී පරිකල්පන ශක්තිය මෙහෙයවා විවිධ භාණ්ඩ යොදාගෙන ඒවා තම රංගනය සඳහා නිර්මාණාත්මකව යොදාගත හැකිය. එහිදී තමාට අවශ්‍ය නාට්‍යෝපකරණයට වඩාත් සමාන උපකරණ භාවිතයෙන් ප්‍රේක්ෂකයාට චරිතය මනාව හඳුනාගැනීමට හැකි වේ.



උදා :

කොස්ස- හැරමිටිය ලෙස, මයික් එකක් ලෙස

පෑන - සිරින්ජයක් ලෙස, බටනලාවක් ලෙස

කෝදුව- කඩුවක් ලෙස, පිහියක් ලෙස

ආදී වශයෙනි. එකම භාණ්ඩයක් උපකරණ කිහිපයක් ලෙසද යොදා ගත හැක. මේ ආකාරයට ක්ෂණික නිරූපණ සඳහා භාණ්ඩ අර්ථවත්ව යොදා ගත හැකිය. එලෙස නාට්‍යෝපකරණ භාවිතයෙන් රංගය වඩාත් පහසු වේ. එලෙස භාවිත කරන නාට්‍යෝපකරණ රංගය සඳහා නිවැරදිව යොදාගැනීම ද අත්‍යවශ්‍ය වේ. ඔබ විවිධ භාණ්ඩ නාට්‍යෝපකරණ ලෙස භාවිත කරමින් නිර්මාණාත්මකව රංගනයේ යෙදෙන්න.

පැවරුම : නාට්‍යෝපකරණ ලෙස භාවිත කළ හැකි භාණ්ඩ කිහිපයක් ඇඳ දක්වන්න.